# යාළු පොඩිත්තෝ



අමීලියා ලුම්බිණී රාජපක්ෂ



"ටිං..ටිං..ටිං..ටිං"

"කීචි..බීචි..කීචි..බීචි"

"කාක්..කාක්..කාක්..කාක්"

"කවුද මේ කෑ ගහන්නේ?"

"ආ..., මේ මගේ යාලුවෝ, මගේ නිවාඩු දවසේ

නිදා ගන්න දෙන්නෙත් නෑ."





"උදෙන්ම නැගිටලා නේද ඔයාලා?

ගොඩාක් බඩගිනි වෙලා වගේ......"

"ඉන්නකෝ .., මම කෑම ගේන්නම්...."





"ටිං..ටිං..ටිං..ටිං.."

"කීචි..බීචි..කීචි..බීචි"

"හා...හා... ඉතිං කෑ ගහන්නේ නැතුව කන්නකෝ..."

"චූටි පැටවුනේ...,ඔයාලගේ බඩ පිරුණද?

එහෙනම් ඉතිං... ඔයාලාගේ අම්මට,තාත්තට,

චූටි පැටියන්ටත් අරගෙන යන්න.

අම්මට තාත්තට කෑම ගෙනහින් දුන්නම

පිං ලැබෙනවා නේද පැටියෝ?"





"අද මට ගොඩාක් වැඩ තියෙනවා

අම්මට උදව් කරන්නත් ඕනේ...."

"පාඩම් කරන්නත් තියෙනවා..."

චූටි පැටියෝ, මට කරදර කරන්න එපා....."






"මම හැමදාම කුරුලු ලෑල්ලට කෑම දමනවා,

වතුර දමනවා."

"චූටි පැටව් ඇවිත් කෑම කනකොට මට හරිම සතුටුයි. මගේ පංතියේ මගේ ගුරුතුමී කිව්වේ සතුන්ට කෑම දෙන එක ලොකු පිනක් කියලා."





"ඉතිං ඔයාලාත්, මං වගේ කුරුලු ලෑල්ලක් හදලා

කෑම,බොන්න වතුර, තියන්න පුරුදුවෙන්න."